

## බිරින්දෑවරු
ආනන්ද ගුණතිලක - හොපර්ස් ක්‍රොසිං

අප පරදවා හැම උදයෙම ඇඳෙන් බැස
ගේ දෙර සියලු වැඩ අරඹයි, පුරුදු ලෙස
දැක නැත කිසි දිනෙක නිදනා හැටි අලස
කෙතරම් කඩිසරද ඇය බිරිඳක් විලස

පිටවී ගොසින් අපි රැකියාවට කියලා
කය හා මනස වෙහෙසා සේවය කරලා
ආතතියක් නැතත් ඒ පැය අට ගෙවලා
තව තව විවේකය ගන්නට එමු දුවලා

දරුවන්ගේ වැඩයි තම සැමියගේ වැඩයි
මුලුතැන් ගෙයි සියලු කටයුතු උයන වැඩයි
මුලු පවුලේම රෙදි සෝදන පිහින වැඩයි
හවසට අපි එද්දි ගෙදරට, "ලොවම හැඩයි"

පින්කම වෙනුවෙනුත් ඇය මුල් තැන ගන්නේ
යුතුකම් කරන්නත් ඇගෙ මතකෙට එන්නේ
දහසක් වැඩ ඇතත් නැහැ 'හති' පෙන නන්නේ
සමහරු ඇයට පොඩි දේටත් ගොර වන්නේ

රැකියාවක් කලත් සමහර බිරින දලා
වගකීමෙන් කරති ගෙයි වැඩ නොපිරි හෙලා
කට මැත දෙඩන මුත් සමහරු පිරිමි වෙලා
දහයෙන් එකක්වත් පෙන්නනු මැන, කරලා

දින කීපයක් ඒ අය ලෙඩ උනොත් හෙම
නැතිනම් පිට වෙලා නම් වෙතට මව් බිම
මුලු ගේ පුරා රජයන පාලුව බිඳුම
මට නම් බැහැ, ඔබට හැකි වේවිද කොහොම

දනය හෝ සතුටු සාදය ගෙදර ඇතී
ගෘහණිය නිතර හැම දේකම මුලට එතී
අවතක්සේරුවෙන් ඇය දෙස බලන නිතී
සමහරු ඇතත්, වැඩි දෙන ඒ වගෙ නොවෙතී

කා බී මත් වෙලා සමහරු ගෙදර නිදී
නිදිමත උනත් ගෘහණිය බර කොටස අදී
කවියක් ලියු නමුදු බිරිඳට වැනුම දිදී
ඇය ගැන ලියන්නට මගෙ කවි දැනුම මදී

## කැස්වටුවන්ගේ කථාව
අතුල විජේවික්‍රම

පුරුදු ගම් බිම්
අතැර

යෝධ පෙන්ගුයින්
කුරුල්ලන් මැද
බියෙන් සැඟවී
අහුල ලා කන

පාට තුනපහ
පුංචි පැටවුන්
ලෝකයට මුදවා හරින්නට
නේක වැඩ කර යෝධයින් හට

රිදෙන තටු පිරිමදින අතරේ
හීන දකිමින් නිදි වැළඳ ගත්
කැස්වටුවකුගේ කථාවක් ගැන
කිව්ව මතකයි තාත්තා මට
නින්ද එනතුරු ඒ දවස් වල

තුරුළු කරගෙන
පිරිමදින හිස ...

## අහිමි සෙනෙහස
ආනන්ද ගුණතිලක හොපර්ස් ක්‍රොසිං

ගිලී නැහැවුනෙමි ඔබගේ සෙනෙහෙ ගඟේ
ඔබ හැර නෙතට වෙන දසුනක් නොවිය අගේ
ඈතට ගියා ඔබ දසුනින් මිදී මගේ
අතරමං වුනෙමි ජීවන ගමන් මගේ

ඔබ ගෙන ආ සතුට නැත අමතක වන්නේ
තවමත් එය පතා හදවත වැලපෙන්නේ
ඔබ අහිමිව ගිය දුකයි හද ගිනි අවුලන්නේ
සැනසුම කොහිද නැත මා තවමත් දන්නේ

අප තැනු අහස් මාලිග බිම වැටී ඇතේ
එහි සුන්බුන් පමණි අද ඉතිරිව ඇත්තේ
සැකයක් නොමැත යලි එය ගොඩනැගෙනු නැතේ
ආදරයේ සුවඳ වුව එ මත නැත්තේ

හදවත දවන දුක කඳුලිනි පිටවූයේ
ඒ කඳුලින් නොමැත ඔබේ හද උණු වූයේ
විසඳිය නොහැකි පැනයකි සිත මත වූයේ
මෙලෙසින් වෙන් වන්න ඇයි අප හමුවූයේ




## මඟක් තැනුමට බැරිද ?
ගාමිනී දසනායක



ගෙවී යන වසරක
මතකයන් ගෙන පෙරට
මා පුංචි මුනුපාරහට
සුබ පැතුම් ලැබෙන විට
සීයා ලෙසින් මා නිකම් සිටියොත්
බලා කියාවි ද නුඹ දිනෙක
සුබ පැතුවෙ නෑ කියා......
නුඹ වන් වූ උපන් දින
සමරන......

එවන් වූ මුනුපුරන් ලොව පුරා
දැල්වූ නෙතින් බලා සිටිමින්
පතන එකම පැතුමක් දැනින
මගේ හදවතට....

අතැර බිය කරු වූ යුද ගැටුම්
නවතා නසාලන අවි තැනුම
සාගින්දරට යට වී මියෙන
වසරක්වත් සමරන්න බැරි වෙන
පුංචි මුනුපුරන්හට ජීවිතය දෙන්නට
මඟක් තැනුමට බැරිද ?

## අවදි වන්නට සිතක්වත් නැත
පද්මා රත්නායක - සගා නගරය ජපානය

හැරී නොබලා යලිත් පිටුපස - ජීවිතේ මග පිය නගන්නේ
වැරදි වූ තැන් සොයා පල නැත - අතීතය නැත නැවත එන්නේ

පියවි ලෝකය පාළු වී ඇත - හද දවන දුක් ගින්න මත්තේ
හිතේ සැනසුම සොයා යාමට - සිහින ලෝකය පමණි ඇත්තේ

සිහින ලොව වෙත ලොබ කරන සිත - තදින් ඒ දෙස ඇදී යන්නේ
දිවිය සුරකින බලය ඇති මුත් - අනාගතයන් නැත පෙනෙන්නේ

සිහින මැද සිටිනවා නම් - තවම මා ඉන් අවසි වී නැත
දැවුනු හද ඉන් සතුටු වේ නම් - අවදි වන්නට සිතක්වත් නැත

